# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2418/44 - 2025 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2025.01.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1163, තුන්මෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ලබුයාය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/KPW/2021/70 හා 2021.05.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයෙන්ගෙන් යුක්ත ඉඩම් කොටස් (06)ට මායිම්:

01. කැබලි අංක **1 - සඳහන් නොවේ - ප්‍රමාණය: හෙක්. 0.0284**
උතුරට, නැගෙනහිරට සහ දකුණට: රජය හිමිකම් කියන මහනුගලන්දවත්ත; බටහිරට: ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය හිමිකම් කියන මහනුගලන්දවත්ත සහ රජය හිමිකම් කියන මහනුගලන්දවත්ත.

02. **කැබලි අංක 2 - සඳහන් නොවේ - ප්‍රමාණය: හෙක්. 0.0047**
උතුරට: ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය හිමිකම් කියන මහනුගලන්දවත්ත; නැගෙනහිරට: රජය හිමිකම් කියන මහනුගලන්දවත්ත; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; බටහිරට: රජය හිමිකම් කියන මහනුගලන්ද-වත්ත සහ ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය හිමිකම් කියන මහනුගලන්දවත්ත.

03. කැබලි අංක **3 - මහනුගලන්දවත්ත - ප්‍රමාණය: හෙක්. 1.9622**
උතුරට: රජය හිමිකම් කියන මහනුගලන්දවත්ත; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ 4 වැනි බිම කැබැල්ල; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; බටහිරට: රජය හිමිකම් කියන මහනුගලන්දවත්ත.

04. **කැබලි අංක 4 - මහ ඇළ - ප්‍රමාණය: හෙක්. 0.3924**

උතුරට: මෙම අනුරේඛනයේ 3 වැනි බිම් කැබැල්ල සහ රජය හිමිකම් කියන මහනුගලන්දවත්ත; නැගෙනහිරට: මහ ඇළ, ඩබ්ලිව්. එම්. ලාලනී ස්වර්ණලතා හිමිකම් කියන කොස්ගහමුල කුඹුර, කේ.එම්. විජේවර්ධන හිමිකම් කියන කොස්ගහමුල කුඹුර, මෙම අනුරේඛනයේ 5 සහ 6 වැනි බිම් කැබලි; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; බටහිරට: මෙම අනුරේඛනයේ 3 වැනි බිම් කැබැල්ල.

05. **කැබලි අංක 5 - මහනුගලන්දවත්ත - ප්‍රමාණය: හෙක්. 1.1188**

උතුරට: මෙම අනුරේඛනයේ 4 වැනි බිම් කැබැල්ල සහ කේ.එම්. විජේවර්ධන හිමිකම් කියන කොස්ගහමුලකුඹුර; නැගෙනහිරට: කේ. එම්. එස්. ජී. අබේවර්ධන හිමිකම් කියන කොස්ගහමුලවත්ත; දකුණට: කානුව සහ මෙම අනුරේඛනයේ 6 වැනි බිම් කැබැල්ල; බටහිරට: මෙම අනුරේඛනයේ 4 වැනි බිම් කැබැල්ල.

06. **කැබලි අංක 6 - සඳහන් නොවේ - ප්‍රමාණය: හෙක්. 0.0119**

උතුරට: මෙම අනුරේඛනයේ 5 වැනි බිම් කැබල්ල; නැගෙනහිරට: කේ. එම්. එස්. ජී. අබේවර්ධන හිමිකම් කියන කොස්ගහමුලවත්ත සහ කාණුව; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; බටහිරට: මෙම අනුරේඛනයේ 4 වැනි බිම් කැබැල්ල.

කේ.ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 04 වැනි දින,
මගේ අංකය : 4-3/193/2020/BOI/73.
කෘෂි කර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 - 0101